Tell Us 'අපට කියන්න' ප්‍රතිපත්තිය

පළමුවන අනුවාදය, 2024 ජනවාරි

Primark හි බැඳීම

Primark හි නිවැරදි ආකාරයෙන් ව්‍යාපාර කටයුතු සිදු කිරීම අපේ අරමුණ වේ. සෑම විටම අවංකව කටයුතු කිරීමට අපි කැප වී සිටිමු. වගකීම් සහගත පිළිවෙත් හට මුල් තැන ලබා දෙන විවෘත භාවය, අවංකභාවය සහ පරිපූර්ණත්වයෙන් යුත් සංස්කෘතියක් අපි ආඩම්බරයෙන් ප්‍රවර්ධනය කරන අතර ම, එය ආරක්ෂා කිරීම ද අරමුණක් කර ගන්නෙමු.

අපගේ සැපයුම් දාමය තුළ සේවකයින් සඳහා ආරක්ෂිත හා යහපත් සේවා ස්ථාන ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු. මෙම සේවකයින්, සැපයුම්කරුවන් සහ Primark නිෂ්පාදනය කරන අඩවි වලට සමීපව සිටින පුද්ගලයින්ට කතා කිරීමට සහ ඔවුන් අත්විඳින නුසුදුසු, වංචනික, නීති විරෝධී හෝ භයානක හැසිරීම් පිළිබඳව අපට පැවසීම සඳහා ඔවුන්ට බලයක් ඇති විට අපි වඩාත් ශක්තිමත් සමාගමක් වන බව අපි දනිමු. අපගේ සැපයුම් දාමයේ සියලු මට්ටම්වල සහ එහි ප්‍රජාවන්හි ඵලදායී හා අවංක සන්නිවේදනය අපි දිරිමත් කරමු. අපගේ Tell Us ප්‍රතිපත්තිය එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර හා මානව හිමිකම් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්ම (UNGPs) හා අප දැනුවත්ව වෙනස් වන නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

ඔබ අපට පැවසිය යුත්තේ ඇයි?

ඔබ අපගේ සැපයුම් දාමයේ සේවකයෙකු හෝ සැපයුම්කරුවෙකු නම් හෝ ඔබ Primark නිෂ්පාදන කරන වෙබ් අඩවි හා සමීප අයෙක් නම් හා නුසුදුසු, වංචනික, නීති විරෝධී හෝ භයානක යැයි ඔබ විශ්වාස කරන ඕනෑම දෙයක් පිළිබඳව ඔබ දැනුවත් වන්නේ නම්, ඔබ ඉදිරියට පැමිණ ඔබේ කනස්සල්ල ප්‍රකාශ කිරීමට අපට අවශ්‍ය වේ . ඔබට මෙය කිරීමට ඉඩ ලබා දෙන සහ (නීතිමය හේතූන් මත අපට අනාවරණය කළ යුතු නොවේ නම්) රහස්‍යභාවය සහ නිර්නාමිකභාවය සුරකින, Tell Us, නමින් වූ පද්ධතියක් අප සතුව ඇත. එය මෙම Tell Us ප්‍රතිපත්තිය මගින් ආවරණය කර ඇත. හඬ නැගීමෙන්, එම ගැටළු විමර්ශනය කිරීමට සහ විසඳීමට පියවර ගත හැකි ය.

මෙම Tell Us ප්‍රතිපත්තිය මගින් ඔබේ සාමාන්‍ය සේවා ස්ථාන ප්‍රතිපත්ති සහ පැමිණිලි කිරීමේ හා විනය යාන්ත්‍රණ හෝ ඔබට භාවිත කළ හැකි වෘත්තීය සමිති හෝ කම්කරු සමිති ක්‍රියාකාරකම් වැනි ක්‍රියා පටිපාටි ප්‍රතිස්ථාපනය කිරීමක් සිදු නොකරන බව කරුණාවෙන් සලකන්න.

Tell Us අදාළ වන්නේ කාට ද?

අපි Primark සැපයුම් දාමය පුරා සියලු කම්කරුවන් හා සැපයුම්කරුවන් සහ Primark නිෂ්පාදන නිපදවන අඩවි වලට සමීපව සිටින ජනතාව හඬ නැගීමට සහ "අපට පැවසීමට" දිරිමත් කරන්නෙමු. ඕනෑම ආකාරයක සේවකයෙකුට, එනම් පූර්ණ කාලීන, අර්ධ-කාලීන හෝ නිත්‍ය, තාවකාලික හෝ නියෝජිත, ගෘහ සේවික, තෙවන පාර්ශ්වීය, පුහුණු හෝ ස්වේච්ඡා සේවකයන් වුව ද, Tell Us භාවිත කළ හැකි ය.

Primark සඳහා සෘජුව ම සේවය ලබා දෙන සම-සගයන් හා අපට වෙළඳසැල් සතු ඕනෑම රටක සිටින Primark කොටස්කරුවන්, නියෝජිතයින්, කොන්ත්‍රාත්කරුවන්, බාහිර උපදේශකයින්, තෙවන පාර්ශ්වීය නියෝජිතයින්, ව්‍යාපාර හවුල්කරුවන් සහ අනුග්‍රාහකයින් Primark හි Speak Up යාන්ත්‍රණය භාවිත කිරීමට දිරිමත් කරනු ලැබේ. ඔබට මෙහි වැඩිදුර දැන ගත හැකි ය: https://corporate.primark.com/en-gb/primark-cares/resources/social.

ඔබ අපට කුමක් පිළිබඳව පැවසිය යුතු ද?

නුසුදුසු, වංචනික, නීති විරෝධී හෝ භයානක හැසිරීමක් සිදුවෙමින් පවතින බව ඔබ විශ්වාස කරන්නේ නම්, අපි ඔබට සහාය වනු ඇතැයි යන විශ්වාසය සමඟ ඔබේ කනස්සල්ල ඉස්මතු කළ හැකි ය. ඔබ පහත සඳහන් ඕනෑම තත්වයක් වාර්තා කළ යුතු ය:

- පහත දෑ ඇතුළුව Primark හි සැපයුම්කරුවන්ගේ චර්යා ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම්:
  - අනියම් හෝ බලහත්කාර ශ්‍රමය හෝ වෙනත් නූතන වහල්භාවය පිළිබඳ වූ ඇඟවීමක්;
  - නීත්‍යානුකූලව ලැබිය යුතු වැටුප් හා ප්‍රතිලාභ නොගෙවීම;
  - වෘත්තීය සමිති හෝ සාමූහික කේවල් කිරීම් වලට එක් වීම හෝ එවැන්නක් පිහිටුවීම වැළැක්වීම;
  - අනාරක්ෂිත හෝ සෞඛ්‍යාරක්ෂිත නොවන සේවා පරිසරය;
  - නීතිමය උපරිමයෙන් ඔබ්බට දුවයන සේවා පැය ගණන්;
  - වෙනස් කොට සැලකීම, හිංසනය හෝ හිරිහැර කිරීම;
  - අයුතු හෝ බලහත්කාර හැසිරීම;
  - පරිසර හානිය; හා
  - අල්ලස් සහ දූෂණ.
- මානව හිමිකම් හා සදාචාරාත්මක ගැටළු හා පරිසරය සම්බන්ධයෙන් වූ වෙනත් Primark හි ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම;
- රහස්‍ය තොරතුරු හෝ වෙනත් දත්ත අනවසරයෙන් අනාවරණය කිරීම හා සම්බන්ධ උල්ලංඝනයන්;
- Primark ඇණවුම් සඳහා අනවසර උප-ගිවිසුම් ගත වීම්;
- වංචනික මූල්‍ය ක්‍රියාකාරකම්; හා
- ඉහත සඳහන් ඕනෑම දෙයක් හිතාමතාම සැඟවීම.

ඉහත ලැයිස්තුවට ඇතුළත් කර නොමැති ඕනෑම දෙයක් 4 වන විකල්පය (පහත විස්තර කර ඇති පරිදි) භාවිත කරමින් Tell Us හරහා වාර්තා කළ හැකි ය.

යම් කරුණක් මෙම Tell Us ප්‍රතිපත්තියේ විෂය පථයට අයත් දැයි ඔබට විශ්වාස නැත්නම්, හෝ විධිමත් වාර්තා කිරීමකට පෙර යමෙකු සමඟ පෞද්ගලිකව මේ පිළිබඳව කතා කිරීමට ඔබට අවශ්‍ය වන්නේ නම්, ඔබේ සෘජු කළමනාකරු හෝ අධීක්ෂක සමඟ කතා කිරීමට හෝ (ලද හැකිනම්) ඔබේ අඩවියේ හෝ සේවා ස්ථානයේ වෘත්තීය සමිතියක් හෝ කම්කරු කමිටු නියෝජිතයෙකු සමඟ කතා කිරීමට අපි නිර්දේශ කරමු.

ඔබ ගැටළු මතු කරන්නේ සහ අපට ඒ බව කියන්නේ කෙසේ ද?

ඔබ සැලකිලිමත් වන ගැටළුවක් මතු කිරීම සඳහා කරුණාකර පහත විකල්ප බලන්න. **ඔබ හෝ වෙනත් අයෙකු හදිසි අනතුරකට ලක්ව සිටින්නේ නම් කරුණාකර ඔබේ ප්‍රාදේශීය හදිසි සේවාව අමතන්න.**

විකල්පය 1: ඔබේ සෘජු කළමනාකරුට / අධීක්ෂකවරයාට කියන්න

ඔබේ සෘජු කළමනාකරුට හෝ අධීක්ෂකවරයාට වාචිකව හෝ ලිඛිතව ඔබ සැලකිලිමත් වන කරුණු මතු කිරීමට අපි යෝජනා කරමු. නිරීක්ෂණය කරන ලද කිසියම් හැසිරීමක් හේතුවෙන් ඔබේ සෘජු කළමනාකරු හෝ අධීක්ෂකවරයා සම්බන්ධ කර ගැනීම පිළිබඳව ඔබට යම් අසතුටක් පවතින්නේ නම්, පහත සඳහන් විකල්ප වලින් එකක් භාවිත කිරීමට අපි ඔබව දිරිමත් කරමු.

විකල්පය 2: ලද හැකි අවස්ථාවල දී, ඔබේ ප්‍රාදේශීය වෘත්තීය සමිතිය හෝ සේවක කමිටු නියෝජිතයා සම්බන්ධ කර ගන්න

ඔබේ සෘජු කළමනාකරු හෝ අධීක්ෂකවරයා සමඟ මෙම කාරණය මතු කිරීමට නොහැකි බවක් ඔබට හැඟී ඇත්නම්, හෝ ඔබේ සෘජු කළමනාකරු හෝ අධීක්ෂකවරයා ඔබේ ගැටළුවට නිසි අවධානය යොමු කර නොමැති බව ඔබට හැඟෙන්නේ නම්, ලද හැකි අවස්ථාවන් වල දී, ඔබට අදාළ ගැටළුව ඔබේ ප්‍රාදේශීය වෘත්තීය සමිති හෝ සේවක කමිටු නියෝජිතයාගේ අවධානයට යොමු කළ හැකි ය.

විකල්පය 3: ලද ගත හැකි අවස්ථාවන් වල දී, ඔබේ ප්‍රාදේශීය සේවක සහාය සම්බන්ධ කර ගන්න (ඇමුණුම 1 බලන්න)

ඔබේ සෘජු කළමනාකරු හෝ අධීක්ෂකවරයා හෝ වෘත්තීය සමිති හෝ කම්කරු කමිටු නියෝජිතයා සමඟ අදාළ ගැටළුව මතු කිරීමට ඔබට නොහැකි නම්, හෝ ඔබ මෙය දැනටමත් සිදු කළ ද ඔබේ ගැටළුව තවමත් විසඳා නොමැති බව ඔබට හැඟේ නම්, ලද හැකි අවස්ථාවන් වල දී, ඔබට මෙම ගැටළුව පහත ඇමුණුම 1 හි සඳහන් ඔබේ ප්‍රාදේශීය සේවක සේවය වෙත යොමු කළ හැකි ය.

විකල්පය 4: TELL US අංකය (විස්තර පහතින් සහ Primark නිෂ්පාදන නිපදවන කර්මාන්තශාලාවල දැන්වීම් පුවරුවල ඇත)

විකල්ප 1, 2 සහ 3 ඔබට ලද නොහැකි නම්, හෝ අනෙක් විකල්ප හරහා ඔබේ ගැටළුව පිළිබඳව සැලකිල්ල යොමු වී නොමැති නම්, කරුණාකර පහත විස්තර භාවිත කරමින් Tell Us දුරකථන අංක, වෙබ් සේවාව හෝ ස්මාර්ට් ජංගම දුරකථන යෙදුම භාවිත කරන්න.

දුරකථනය	**වෙබ් ලිපිනය**	**පිවිසුම් කේතය**	**QR කේතය**
ශ්‍රී ලංකාව: 94720910370	https://primark.speakup.report/tellus	106502	

ඔබ Tell Us දුරකථන අංකය හරහා සම්බන්ධ වීමට තෝරා ගන්නේ නම්, ඔබට පටිගත කළ පණිවිඩයක් (බොහෝ අවස්ථාවල දී ඔබේ දේශීය භාෂාවෙන්) ඇසීමට ලැබෙනු ඇති අතර එමඟින් Primark හට අනන්‍ය වූ පිවිසුම් කේතය, 106502, ලබා දෙන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. එවිට ඔබට ඔබේ ගැටළු විස්තර කරන ඕඩියෝ පණිවිඩයක් පටිගත කළ හැකි ය.

ඔබ Tell Us වෙබ් සේවාව භාවිත කිරීමට තෝරා ගන්නේ නම්, ඔබට Primark පිවිසුම් කේතය, 106502, ලබා දීමට අවශ්‍ය වන අතර ඉන් පසුව ඔබේ ගැටළුව විස්තර කරන පණිවිඩයක් ලිවීමට අවස්ථාව ලබා දෙනු ඇත. වෙබ් සේවයේ අන්තර්ගතය ඔබේ දේශීය භාෂාවෙන් වේ.

ඔබ Tell Us ස්මාර්ට් ජංගම දුරකථන යෙදුම භාවිත කිරීමට තෝරා ගන්නේ නම්, ඔබට QR කේතය ස්කෑන් කර යෙදුම නොමිලේ බාගත කළ හැකි ය. එවිට ඔබට Primark පිවිසුම් කේතය, 106502, ලබා දීමට අවශ්‍ය වන අතර ඉන් පසුව ඔබේ ගැටළුව විස්තර කරන පණිවිඩයක් ලිවීමට අවස්ථාව ලබා දෙනු ඇත. යෙදුමේ අන්තර්ගතය ඔබේ දේශීය භාෂාවෙන් වේ.

Tell Us දුරකථන අංකය, වෙබ් ලිපිනය, පිවිසුම් කේතය සහ QR කේතය පිළිබඳ විස්තර Primark නිෂ්පාදන නිපදවන කර්මාන්තශාලාවල ප්‍රදර්ශනය කරන පෝස්ටර් වල ඔබට ලබා ගත හැකි ය. ඔබට Tell Us යාන්ත්‍රණයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වීම සහ ඒවා භාවිත කිරීමේ දී සුවපහසු බවක් ඇති කිරීම පිළිබඳව අපි ඉතා වැදගත් සැලකිල්ලක් දක්වමු. අපගේ සැපයුම්කරුවන්ගේ කර්මාන්තශාලා පිළිබඳ වූ අපගේ නිත්‍ය සමාජ විගණන වැඩසටහනේ කොටසක් ලෙස, පෝස්ටර් සහ වෙනත් අදාළ තොරතුරු වෙත වූ ප්‍රවේශය මෙන්ම මෙම යාන්ත්‍රණය පිළිබඳ වූ ඔබේ අවබෝධය ද අපි පරීක්ෂා කර බලන්නෙමු.

Primark මෙලෙස සමඟ මතු කරන ලද ගැටළු පිළිබඳ වාර්තා අදාළ නීතිවලට අනුකූලව රඳවා තබා ගනු ඇත. Tell Us දුරකථන අංකය සම්බන්ධ ඔබේ ඕඩියෝ පණිවිඩයේ පිටපතක් හෝ ශ්‍රව්‍ය පටිගත කිරීමක් සිදු කරනු ලැබේ.

ඔබේ වාර්තා කිරීම පහත දැක්වෙන අපගේ Tell us ක්‍රියා පටිපාටියට අනුකූලව විසඳනු ඇත.

ඔබ Tell Us පද්ධතිය භාවිත කරමින් Primark හා සම්බන්ධ වුවහොත් ඊළඟට සිදුවන්නේ කුමක් ද?

ඔබට අනන්‍ය සිද්ධි අංකයක් ලැබෙනු ඇත. ඔබ නැවත Tell Us දුරකථන අංකය, වෙබ් සේවාව හෝ ස්මාර්ට් ජංගම දුරකථන යෙදුමට පිවිස මෙම අංකය භාවිත කරන්නේ නම්, ඔබේ වාර්තාව ලද බවට පිළිගැනුම (දින 7 කට පසුව), වැඩි විස්තර සඳහා වූ ඕනෑම ඉල්ලීමක් සහ ඔබේ ගැටලුවේ තත්ත්වය පිළිබඳ ඕනෑම යාවත්කාලීන කිරීමක් ඇසීමට/කියවීමට ඔබට හැකි වනු ඇත.

දින හතක් ඇතුළත ඔබේ වාර්තාව ලද බවට දැනුම් දීමට අපි බලාපොරොත්තු වෙමු. එවිට අපි මූලික තක්සේරු කිරීමක් සිදු කරන අතර, එහි කොටසක් ලෙස ඔබේ ගැටළුව පිළිබඳ අතිරේක තොරතුරු ලබා දෙන මෙන් ඔබෙන් ඉල්ලා සිටිය හැකි ය. ඔබ විසින් අනාවරණය කරගත් දේ මත පදනම්ව, ඉදිරියට ගත යුතු ක්‍රියාමාර්ග සහ ඊට සම්බන්ධ කාල සීමාවන් පිළිබඳ තීරණය කෙරෙනු ඇත.

ඕනෑම විමර්ශනයක ප්‍රතිඵල සහ ඒ සම්බන්ධව ගනු ලැබූ හෝ සැලසුම් කරනු ලැබූ ක්‍රියාමාර්ග සහ මෙම ක්‍රියාමාර්ග සඳහා පදනම් වූ හේතු (රහස්‍යතා අවශ්‍යතාවන් හා අනුකූලව) ඔබට දන්වනු ලැබේ. Tell Us පැමිණිලි විමර්ශනය කිරීම පිළිබඳව වගකීම දරන පුද්ගලයන් ස්වාධීන හා අපක්ෂපාතී බව අපි සහතික කරමු.

ඔබට ඕනෑම වේලාවක ලැබුණු ප්‍රතිචාරයක් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඉහත Tell Us ප්‍රතිපත්තියේ විස්තර කර ඇති වෙනත් සම්බන්ධතා සම්බන්ධ කර ගත හැකි බව කරුණාකර මතක තබා ගන්න. එවැනි ඕනෑම ගැටළුවක් සාධාරණීය ලෙස හා නිසියාකාරව හැසිරවීම සහතික කිරීමට අපි කැපවී සිටිමු.

Tell Us පද්ධතිය භාවිතයෙන් ඔබ Primark හා සම්බන්ධ වුවහොත් අපි ඔබව ආරක්ෂා කරන්නේ කෙසේ ද?

ප්‍රතිවිපාක වලින්

යම් ගැටළුවක් මතු කරන කිසිවෙකුට එරෙහිව පළිගැනීම් සඳහා අපි කිසි විටකත් ඉඩ නොදෙන්නෙමු: ගැටළුවක් මතු කරන ඕනෑම පුද්ගලයෙකු අහිතකර ප්‍රතිවිපාක, පළිගැනීම් හෝ හානිවලින් ආරක්ෂා කළ යුතු වේ. යම් ගැටළුවක් මතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔබට හෝ ඔබේ රැකියාවට කිසියම් හානියක් සිදුවන බව ඔබට හැඟෙන්නේ නම්, ඒ පිළිබඳව වහාම Tell Us දුරකථන අංකය, වෙබ් සේවාව හෝ ස්මාර්ට් ජංගම දුරකථන යෙදුම භාවිතයෙන් වාර්තා කළ යුතු ය.

ඔබේ අනන්‍යතාවය සහ පෞද්ගලිකත්වය

ඔබට අප සමඟ විවෘතව කතා කිරීමට හැකි වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. ඔබ සම්පූර්ණයෙන්ම නිර්නාමික වීමට කැමති නම්, එය ඔබේ කැමැත්ත වේ, අපගේ Tell Us දුරකථන අංකය, වෙබ් සේවාව හෝ ස්මාර්ට් ජංගම දුරකථන යෙදුම භාවිත කර ඔබට නිර්නාමිකව එය කළ හැකි ය. කරුණාකර ඔබේ ගැටළුව විසඳීමට අපට උපකාරී වනු ඇතැයි ඔබ සිතන ඕනෑම තොරතුරක් බෙදා ගන්න. ඔබට යමක් අමතක වී ඇත්නම් ඒ පිළිබඳව කනස්සල්ලට පත් නොවන්න, නැවත අප හා සම්බන්ධ වීමට ඔබට විකල්පයන් ඇත, එසේ නොමැතිනම් ඔබේ ගැටළුව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අපෙන් සෘජුවම ඔබව සම්බන්ධ කර ගන්නා ලෙසද ඔබට ඉල්ලා සිටිය හැකි ය.

ඔබ ඔබේ අනන්‍යතාව හෙළි කරන්නේ නම්, ඔබේ අනන්‍යතාව පුද්ගලික හා රහස්‍ය ලෙස තබා ගැනීමට අවශ්‍ය වන සියලු සාධාරණ පියවර අපි ගන්නෙමු. අපි ඔබේ නම අදාළ පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා හෝ නීතියෙන් අවශ්‍ය කරන පරිදි වෙනත් ආකාරයකින් එය දැනගත යුතු පුද්ගලයින්ට පමණක් අනාවරණය කරන්නෙමු. මෙම Tell Us ප්‍රතිපත්තිය යටතේ මතු කරන ලද ඕනෑම ගැටළුවක කොටසක් ලෙස ඔබ හෝ වෙනත් පුද්ගලයෙකු හඳුනා ගැනීමට ඉඩ සලසන ඕනෑම පුද්ගලික දත්තයක් මෙම Tell Us ප්‍රතිපත්තියේ විස්තර කර ඇති අරමුණු සඳහා පමණක් සහ ඇමුණුම 2 හි සඳහන් පෞද්ගලිකත්ව නිවේදනයට අනුකූලව භාවිත කරනු ඇත.

ඔබ නිර්නාමික වීමට තෝරා ගත්තද, ප්‍රකාශිත පැමිණිලි වාර්තාවේ සැපයුම් දාමයේ ඇති සේවකයින් පිළිබඳ තොරතුරු අපි ඇතුළත් නොකරන්නෙමු, මෙය ඔවුන්ගේ අනන්‍යතාවය හඳුනා ගැනීමට හේතු වනු ඇත.

වෙනත්

නීතියෙන් වෙනත් ආකාරයකින් නියම කර නොමැති නම්, මෙම Tell Us ප්‍රතිපත්තිය ඔබේ රැකියා ගිවිසුමේ කොටසක් නොවන අතර Primark සමඟ එවැනි ගිවිසුමක් සඳහා පදනමක් ලබා දෙන්නේද නැත; ඕනෑම වේලාවක අපට මෙම Tell Us ප්‍රතිපත්තිය සංශෝධනය කළ හැකි ය.

ඇමුණුම 1

ප්‍රාදේශීය සේවක සහාය සේවය

නම	රට	දුරකථනය සහ/හෝ වෙබ් අඩවිය
Amader Kotha	බංගලාදේශය	08006666666
MUDEM සේවක සහාය මධ්‍යස්ථානය	තුර්කිය	https://iscidestekmerkezi.org
RMG තිරසාරභාවය පිළිබඳ කවුන්සිලය (RSC)	බංගලාදේශය	ආරක්ෂක පැමිණිලි: 08801769969000 සාමාන්‍ය විමසීම්: 08801766695900 0880241081863-6
Ungal Kural	ඉන්දියාව	1-800-8333-12

ඇමුණුම 2

TELL US – ඔබේ පෞද්ගලිකත්වය

යුරෝපීය දත්ත ආරක්ෂණ නීති සම්පාදනයේ අරමුණු සඳහා, Primark අපගේ Tell Us දුරකථන මාර්ගය, වෙබ් සේවාව සහ ස්මාර්ට් ජංගම දුරකථන යෙදුම හරහා ඔබ ලබා දෙන පුද්ගලික දත්ත පිළිබඳව වගකීම දරන දත්ත පාලකයා වේ.

ඔබේ පුද්ගලික දත්ත

අපගේ Tell Us ප්‍රතිපත්තිය යටතේ ලබා දෙනු ලබන පුද්ගලික දත්ත නුසුදුසු, අයුතු, වංචනික, නීති විරෝධී හෝ භයානක හැසිරීම් ("නුසුදුසු හැසිරීම්") පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ අරමුණු සඳහා පමණක් අපගේ Tell Us ප්‍රතිපත්තියට සහ අදාළ නීතිවලට අනුකූලව අපි භාවිත කරන්නෙමු. මෙම නිවේදනය ඔබ නුසුදුසු හැසිරීම් වාර්තා කරන අවස්ථාවන්හි ඒ පිළිබඳව අපි එකතු කරන තොරතුරු ගැන සහ ඒ තොරතුරු Primark තුල බෙදාගන්නා ආකාරය පිළිබඳව පවසයි.

අප විසින් සකසනු ලබන්නේ කුමන පුද්ගලික දත්ත ද?

ඔබ Tell Us දුරකථන අංකය, වෙබ් සේවාව හෝ ස්මාර්ට් ජංගම දුරකථන යෙදුම හරහා ගැටළුවක් වාර්තා කරන්නේ නම් ඔබ හෝ ඔබේ වාර්තාවේ ඔබ විසින් හඳුන්වන ඕනෑම අයෙකු පිළිබඳව ඔබේ වාර්තාවට ඇතුළත් කරන ඕනෑම පුද්ගලික විස්තරයක් අපි එකතු කරමු. ඔබේ නම සඳහන් කරන ලෙස අපි ඔබෙන් ඉල්ලා නොසිටිමු. නිර්නාමිකව මතු කරන ලද ගැටළු බොහෝ දුරට ඵලදායී බවින් අඩු වන බැවින් අපි ඔබව හඳුන්වා දීමට දිරිමත් කරමු, ඒ වගේම ප්‍රමාණවත් තොරතුරු අප සතුව නොමැති නම් පූර්ණ විමර්ශනයක් කළ නොහැකි වීමට හැකි ය.

සමහර විට "සංවේදී පුද්ගලික දත්ත" ලෙස හැඳින්වෙන විශේෂිත කාණ්ඩයකට අයත් පුද්ගලික තොරතුරු ඔබ විසින් ඇතුළත් කිරීමට ඉඩ ඇත. වාර්ගික හෝ ජනවාර්ගික සම්භවය, ආගමික විශ්වාසයන්, ශාරීරික හෝ මානසික සෞඛ්‍යය, වෘත්තීය සමිති සාමාජිකත්වය, ලිංගික දිශානතිය, ලිංගික ජීවිතය පිළිබඳ තොරතුරු, ජෛවමිතික දත්ත, ජානමය දත්ත, අපරාධ වාර්තා සහ අපරාධ ක්ෂණයට අයත් වැරදි හෝ නඩු කටයුතු පිළිබඳ තොරතුරු වැනි කාරණාවලට අදාළ තොරතුරු මෙම යෙදුමට ඇතුළත් වේ.

ඔබ වාර්තාවක විෂය වන්නේ නම් හෝ වාර්තාවක ඔබව නම් කර ඇත්නම්, එසේ කිරීමෙන් විමර්ශනයට අගතියක් විය හැකි නම් හෝ අපට නීතියෙන් එසේ කිරීම තහනම් කර ඇත්නම් මිස, කඩිනමින් ඒ පිළිබඳව ඔබ දැනුවත් කිරීමට අපි උත්සාහ කරමු.

අපි මෙම දත්ත භාවිතා කරන්නේ කෙසේ ද?

Tell Us දුරකථන අංකය හරහා යොමු කරන ඕඩියෝ පැමිණිලි කෙටියෙන් පටිගත කර පසුව මුල් භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් එහි පිටපත් නිර්මාණය කරනු ලැබේ. Tell Us වෙබ් සේවාව සහ ස්මාර්ට් දුරකථන යෙදුම හරහා ලැබෙන සියලුම පිටපත් සහ වාර්තා, මූලාරම්භ රට කුමක් වුවද, සිද්ධි කළමනාකරණ පද්ධතියක ගබඩා කර Primark වෙත යවනු ලැබේ.

වාර්තාව සමාලෝචනය කිරීම සහ සුදුසු අවස්ථාවල දී ඉදිරිපත් කරන ලද චෝදනා විමර්ශනය කිරීමේ අරමුණු සඳහා අප වෙත යොමු කරන ලද දත්ත භාවිත කරමු. මෙම අරමුණු උදෙසා අපගේ නීත්‍යානුකූල ප්‍රයෝජනය සඳහා අපි සාමාන්‍ය ලෙස මෙම දත්ත භාවිත කරන අතර, අදාළ හා සම්බන්ධිත පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා අපි සුදුසු පියවර ගෙන ඇත්තෙමු.

ඔබේ වාර්තාවට විශේෂ කාණ්ඩවලට අයත් විශේෂිත දත්ත සහ/හෝ අපරාධ හෝ නඩු විභාග සම්බන්ධ පුද්ගලික දත්ත ඇතුළත් වන විට, අපගේ (ඉහත විස්තර කර ඇති පරිදි) නීත්‍යානුකූල අවශ්‍යතාවන් සඳහා, තවද:

- සැලකිය යුතු මහජන අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය වන සහ/හෝ නීතිමය හිමිකම් ස්ථාපිත කිරීම හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විශේෂ කාණ්ඩ වලට අයත් පුද්ගලික දත්ත භාවිත කිරීම සම්බන්ධයෙන්; හා
- නීති විරෝධී ක්‍රියාවන් හඳුනා ගැනීම හෝ වැළැක්වීම සඳහා අවශ්‍ය වන සාපරාධී සණයට අයත් වැරදි හෝ චෝදනා සම්බන්ධ තොරතුරු සම්බන්ධයෙන්, සාමාන්‍ය ලෙස මෙම දත්ත භාවිත කිරීම අවශ්‍ය වේ.

ඔබේ දත්ත බෙදා ගැනීම

සදාචාරාත්මක ගැටළු සම්බන්ධයෙන් Tell Us පද්ධතිය හරහා ඉදිරිපත් කරනු ලබන ඕනෑම වාර්තාවක් මූලික වශයෙන් Tell Us ප්‍රතිපත්තියේ දක්වා ඇති ක්‍රියා පටිපාටි අනුව කටයුතු කිරීම සඳහා Primark ආචාරධර්ම වෙළඳ කණ්ඩායමට යොමු කරනු ලැබේ.

සුදුසු විමර්ශන කටයුතු සඳහා සහාය වීමට අනෙකුත් වාර්තා සාමාන්‍යයෙන් Primark හි අදාළ කණ්ඩායම් වෙත යොමු කරනු ලැබේ.

වැඩිදුර පුහුණුව හෝ වෙනත් ක්‍රියාමාර්ග අවශ්‍ය වන ඕනෑම නැඹුරුතාවක් හෝ සැලකිලිමත් බව දක්වන ක්ෂේත්‍රයන් සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම සඳහා, Primark විසින් සියළුම වාර්තා නිර්නාමිකව සකස් කර Primark හි අවදානම් සහ අනුකූලතා අධ්‍යක්ෂකවරයාගේ කාර්තුමය සමාලෝචනය සඳහා සාරාංශගත වාර්තා වලට යොමු කරනු ඇත.

අපි ඔබේ දත්ත කොපමණ කාලයක් තබා ගන්නවා ද?

පිටපත් නිර්මාණය කළ පසුව මූලික ඕඩියෝ පටිගත කිරීම් මකා දමනු ලැබේ. Tell Us වෙබ් සේවාව සහ ස්මාර්ට් දුරකථන යෙදුම හරහා ලැබෙන පැමිණිලි සහ වාර්තාවල පිටපත් විමර්ශනය කළ යුතු කාල සීමාව සඳහා Tell Us පද්ධතිය තුළ රඳවා තබා ගනු ලබන අතර අදාළ සිද්ධිය 'වසා' දැමීමෙන් පසු තව වසර තුනක කාලයක් සඳහා (අදාළ නීති යටතේ වැඩි කාලයක් අවශ්‍ය නොවන්නේ නම්) රඳවා තබා ගනු ඇත. සියලු හඳුනාගැනීමේ තොරතුරු පසුව මකා දමන අතර වාර්තාවේ වර්ගය, ස්ථානය සහ විමර්ශනයේ ප්‍රතිඵලය පිළිබඳ සංඛ්‍යාන වාර්තාවක් පමණක් අභ්‍යන්තර වාර්තාකරණ අරමුණු සඳහා රඳවා තබා ගනු ලැබේ.

ඔබේ දත්ත රඳවා තබා ගැනීම හෝ මාරු කරනු ලබන්නේ කොතනට ද?

Tell Us දුරකථන අංකය, වෙබ් සේවාව සහ ස්මාර්ට් දුරකථන යෙදුම හරහා යොමු කරන ලද වාර්තා නෙදර්ලන්තය-යුරෝපයේ අපගේ සැපයුම්කරුගේ සේවාදායකවල ගබඩා කරනු ඇත. ඔබේ දත්ත එක්සත් රාජධානියේ සහ අයර්ලන්තයේ Primark විසින් ප්‍රවේශ විය හැකි අතර පසුව වඩාත් සුදුසු ව්‍යාපාර වෙත විමර්ශනය සඳහා යොමු කරනු ලැබේ. මෙයින් අදහස් කරන්නේ ඔබේ දත්ත එක්සත් රාජධානිය, අයර්ලන්තය සහ නෙදර්ලන්තය මෙන්ම අදාළ විමර්ශන කණ්ඩායම් වෙත, ඔවුන් කොතැනක සිටියත්, මාරු කරනු ඇති බවයි.

ඔබේ අයිතිවාසිකම්

ඔබේ පුද්ගලික දත්ත පිටපතක් ඔබට ලබා දෙන ලෙස ඔබට ඕනෑම අවස්ථාවක අපෙන් ඉල්ලා සිටිය හැකි ය. ඔබ ගැන අප සතුව ඇති පුද්ගලික දත්ත සාවද්‍ය හෝ අසම්පූර්ණ යැයි ඔබ සිතන්නේ නම්, එය නිවැරදි කිරීමට හෝ සම්පූර්ණ කරන ලෙසට අපෙන් ඉල්ලා සිටිය හැකි ය. සමහර අවස්ථාවල දී, අපි ඔබේ දත්ත භාවිත කිරීම පිළිබඳ විරුද්ධ වීමට ඔබට අයිතියක් ඇති අතර ඔබේ දත්ත භාවිතය සීමා කිරීමට හෝ එය මකා දැමීමට අපෙන් ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත. කෙසේ වෙතත් මෙම අයිතිවාසිකම් වලට යම් ව්‍යතිරේකයන් ඇත. නිදසුනක් වශයෙන්, එය රඳවා තබා ගැනීම සඳහා නීතියෙන් අපෙන් අවශ්‍ය කරන්නේ නම් හෝ නීතිමය ප්‍රකාශයක් ස්ථාපිත කිරීම හෝ ආරක්ෂා කිරීම සඳහා එය භාවිත කිරීමට අවශ්‍ය නම් ඔබේ දත්ත මකා දැමීමට අපට නොහැකි වනු ඇත.

ඔබ ඔබේ පුද්ගලික දත්ත වලට ප්‍රවේශ වීමට හෝ ඔබේ අයිතිවාසිකම් කිසිවක් ක්‍රියාත්මක කිරීමට කැමති නම්, ඔබ පළමුව dataprotection@primark.ie හරහා Primark දත්ත ආරක්ෂණ කණ්ඩායම හා සම්බන්ධ විය යුතු ය. අපි ඔබේ තොරතුරු හසුරුවන ආකාරය ගැන ඔබට කිසියම් ගැටළුවක් ඇත්නම්, ඔබේ ප්‍රාදේශීය දත්ත ආරක්ෂණ අධීක්ෂණ අධිකාරියට පැමිණිලි කිරීමට ඔබට අයිතියක් ඇත.